# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/42 - 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, ම විසින් 2022 ජුලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2022 දෙසැම්බර් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 01. ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 8 සිට 26 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 7 සිට 25 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(2) එම නිවේදනයෙහි "අංක 04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 15 අයිතමය ඉවත් කිරීමෙන්;

(3) එම නිවේදනයෙහි "අංක 07. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-


1A - G 38403 — 11 (2022/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(අ) එහි II වැනි තීරුවෙහි අංක 15 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

16. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව

(4) එම නිවේදනයෙහි " අංක 09. අධ්‍යාපන අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 34 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 35 සිට 39 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 34 සිට 38 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(5) එම නිවේදනයෙහි " අංක 12. සෞඛ්‍ය අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 27 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

28. වකුගඩු අරමුදල

(6) එම නිවේදනයෙහි "අංක 14. කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 39 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

40. දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළඳපල පුළුල් කිරීම.

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 40 සහ 41 අයිතමයන් පිළිවෙලින් අංක 41 සහ 42 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 16 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

17. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

(7) එම නිවේදනයෙහි "අංක 19. කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 29 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

30. විදාතා මධ්‍යස්ථාන

(8) එම නිවේදනයෙහි "අංක 29. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 8 සිට 18 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 7 සිට 17 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 6 අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 7 සිට 14 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 6 සිට 13 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි "ජාතික සමුපකාර සංවර්ධන ආයතන (සංස්ථාගත කිරීමේ) පනත (2001 අංක 1)" අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

- ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත (2018 අංක 2)
- ආරක්ෂණ පියවර පනත (2018 අංක 3)

EOG 12 - 0286

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.